මගේ අංකය : ඩී28/උපදේශන නිලධාරි/බඳවා ගැනීම්/සීමිත/2026
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2026.10.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

<u>**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම - 2026**</u>

මෙම දෙපාර්තමේන්තුවේ පවතින උපදේශන නිලධාරි තනතුරේ පුරප්පාඩු 10ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ නියාමක සහ සැරයන් තනතුරුවල නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය ඔබ ආයතනයේ සියළු දෙනාම දැනුවත් වන ලෙස ප්‍රසිද්ධ කර, අයදුම්පත් ලබා ගෙන,ඔබගේ නිර්දේශය ද සහිතව 2026.11.20 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන්න(වැටුප් වර්ධක උපයාගෙන ඇති බව පොදු 232 ආකෘති පිටපත් මගින් සනාථ කළ යුතුය.)

**03. නියමිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාල අයදුම්කරු සහ බන්ධනාගාර අධිකාරිවරයා / ආයතන ප්‍රධානියා පෞද්ගලිකවම වගකිව යුතු බව වැඩිදුරටත් දන්වමි.**

**ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## අයදුම්පත් කැඳවීමේ නිවේදනය

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම - 2026**

**01.** මෙම දෙපාර්තමේන්තුවේ පවතින උපදේශන නිලධාරි තනතුරේ පුරප්පාඩු 10ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ නියාමක සහ සැරයන් තනතුරුවල නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. තනතුරෙහි කාර්ය භාරය**

බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ආකාරයකට අදාළ වන මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්තාපනය සහ උපදේශනය,සමාජරෝග වැළැක්වීම, හා උපදේශනය, ආබාධිත පුනරුත්තාපන,මානසික රෝගීන් සම්බන්ධව පුනරුත්තාපන කටයුතු හා උපදේශනය ,බන්ධනගාර නිලධාරීන්ගේ මානසික තත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීමක් ලබා දීමත්, ඒ සඳහා අවශ්‍ය නිර්දේශ හා වැඩසටහන් පිළිබඳව යෝජනා ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අනුමැතිය මත ඒවා ක්‍රියාත්මක කිරීම සහ බන්ධනාගාර නිලධාරීන්ට අවශ්‍ය උපදේශන කටයුතු හා නිලධාරීන්ගේ සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති කටයුතු වලදී අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම.

**03. තනතුරෙහි ස්වභාවය**

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

**04. මාසික වැටුප් පරිමාණය**

**4.1** රු.53,060 – 10 X 800 – 11 X 1,190 – 10 X 1,320 – 5 X 1,350 – 94,100/- (MN 4 – 2025) (2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන්පරිදි රු. 53,060/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ).

**4.2** I වන කාර්යක්ෂමතා කඩඉම උපදේශන නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර සමත් විය යුතුය.

**4.3** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**05. බඳවාගැනීමේ සුදුසුකම්**

**5.1 අධ්‍යාපන සුදුසුකම්**
පිළිගත් ආයතනයකින් ලබාගත් උපදේශනය, අපරාධ විද්‍යාව, සමාජ විද්‍යාව, සමාජ මානව විද්‍යාව,මනෝ විද්‍යාව හෝ ඊට සමගාමී විෂයයන්ගෙන් සමන්විත අවම වශයෙන් වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

**5.2 වෘත්තීය සුදුසුකම්**
බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල වසර 10ක සක්‍රිය සේවා කාලයක් සහිත නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති උපදේශන කටයුතුවල නිරත සැරයන් හෝ නියාමක නිලධාරියකු වීම.

**5.3 පළපුරුද්ද**
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උපදේශනය හෝ පුනරුත්ථාපන කටයුතුවල වසර 03 ක සෘජු පළපුරුද්දක් ලබා තිබීම.

**5.4 කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**5.5. සුදුසුකම් පිළිබඳ සීමාවන්**

i. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය
iii. උපදේශන නිළධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගන්නා තෙක් අනු අංක 5.4 හා 5.5 (i) හි දක්වා ඇති සුදුසුකම් බලපැවැත්වේ.

**06. වයස් සීමාව**

**6.1 අවම සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු විය යුතුය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

**7.1** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| උපදේශනය ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීම | 50 | 25 |
| ජ්‍යෙෂ්ඨත්වය<br>අයදුම්කරු වර්තමාන තනතුරෙහි වසර 05ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ලකුණු ලබා දීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව සිදු කරනු ලැබේ. | 20 | අදාළ නොවේ |
| වෙනත් අධ්‍යාපන සුදුසුකම් | 05 | |
| ලබා ඇති ප්‍රශංසා | 05 | |
| පලපුරුද්ද | 05 | |
| භාෂා ප්‍රවීණතාවය | 05 | |
| පරිගණක දැනුම | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | 100 | |

i. උපදේශන නිලධාරී තනතුරට තෝරා ගැනීමට නම් ඉහත වගුවෙහි උපදේශනය ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 50 න් 25 ක් ලබා ගැනීම අනිවාර්ය වේ.
ii. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය**

**8.1** මෙම නිවේදනයට අමුණා ඇති අයදුම් පත්‍රය අනුව ඉල්ලුම්පත සැකසිය යුතුය.

**8.2** නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්‍ර නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හා නියමිත දිනට නොඑවන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදු වන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

**8.3** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර **"බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2026.11.20 දින හෝ ඊට ප්‍රථම **ආයතන ප්‍රධානියා මගින්** පහත ලිපිනයට එවිය යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
ආයතන ශාඛාව,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර,
කොළඹ 09.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙහි සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීම
ආදර්ශ අයදුම්පත්‍රය

01. i. සම්පූර්ණ නම : ........................................................................................................
ii. මුලකුරු සමග නම: ..............................................................................................

02. තනතුර : ...................................................................................................

03. i. ස්ථිර තනතුරට පත්වූ දිනය: ......................................................
ii. 2026.11.20 දිනට සේවා කාලය: ..................................................
iii. නියාමක හෝ සැරයන් නිලධාරියකු ලෙස බන්ධනාගාර මූලස්ථානයේ සේවය කර ඇති කාලය
......................................... දින සිට .................................... දින දක්වා

04. තනතුරෙහි ස්ථිර කර තිබේද : ...............................................

05. උපන්දිනය : ................................................ 2026.11.20 දිනට වයස: .........................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ....................................... 07.විවාහක /අවිවාහක බව : ..................................

08. සේවය කරනු ලබන බන්ධනාගාර ආයතනය : ……………………………………

09. අධ්‍යාපන සුදුසුකම් : (සහතිකපත්‍රවල පිටපතක් බැගින් අමුණන්න).

| පාඨමාලාවේ නම | පාඨමාලා කාලය (අවුරුදු) | විශයයන් (සමර්ථය) | ලියාපදිංචි අංකය (ශිෂ්‍ය අංකය) | පාඨමාලාව හැදෑරූ ආයතනය | පාඨමාලාව සම්පූර්ණ කල වර්ෂය |
|---|---|---|---|---|---|
| 01.ඩිප්ලෝමා<br>නම :<br>……………………………..<br>……………………………<br>…………………………… | | | | | |
| 02. උසස් ඩිප්ලෝමා<br>නම :<br>……………………………<br>……………………………<br>…………………………… | | | | | |
| 03.උපාධිය<br>නම :<br>……………………………..<br>………………………………<br>……………………………... | | | | | |
| 04.වෙනත් සුදුසුකම්<br>නම : ……………………..<br>……………………………...<br>……………………………... | | | | | |

10. පළපුරුද්ද : (සහතිකපත් හෝ ලිපි මගින් තහවුරු කල යුතුයි)

| | කාලය(වර්ෂ ගණන) | බන්ධනාගාර ආයතනයේ නම |
|---|---|---|
| උපදේශනය | 01.<br>02.<br>03 | 01.<br>02.<br>03. |
| පුනරුත්තාපන කටයුතු | 01.<br>02.<br>03. | 01.<br>02.<br>03. |

(සැ:යු - සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය.සහතිකපත් අමුණා එවනු නොලබන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 03 ඇතුළත අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා තිබේද සහ විසඳීමට විනය පරීක්ෂණ ඇත් ද යන වග : .......................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි යැයි උපදේශන නිළධාරී තනතුර සඳහා බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු වන බව හොඳාකාරව දනිමි.

දිනය : .............................                                    අයදුම්කරුගේ අත්සන : .....................

**12.බන්ධනාගාර අධිකාරීගේ/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

.......................................................................................................නිලධරයා/නිලධාරිනිය..........................දින සිට මෙම ආයතනයේ ස්ථිර ....................................... තනතුරෙහි සේවය කරන බවත්, 2026.11.20 දිනට පූර්වාසන්නයේ නියමිත වැටුප් වර්ධක 05 ක් උපයාගෙන ඇති/ නැති බවත්, සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති/ නැති බවත් සහතික කරමි.

නිලධාරියාගේ අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.

(අදාල නොවන වචන කපාහැර අධිකාරි විසින් නියමිත පරිදි සම්පූර්ණ කල යුතුයි.)

(නිර්දේශ කරනු නොලබන්නේ නම් හේතුව සඳහන් කරන්න.)

හේතුව:..........................................................................................................................................................................
.....................................................................................................................................................

*වැටුප් වර්ධක ලබා ගෙන ඇති බවට පොදු 232 ආකෘති පිටපත් අමුණා ඇත.

............................                                                    ....................................

දිනය                                                    බන්ධනාගාර අධිකාරි / ආයතන ප්‍රධානියා